# සිංහලයේ ආධාරක හෙවත් උපකාරක ක්‍රියා

කඳුරුගමුවේ නාගිත හිමි

Almost all verbs which are described as auxiliaries are main verbs. In Sinhala there is not a concept among scholars on the nature and the status of these verbs by observing morphological, syntactic and semantic behaviour problems related to the nature and behaviour of these verbs can substantially be understood.

## 1. හැඳින්වීම

සිංහලයේ මූලධාතු අතරින් කිහිපයක්. එනම් ගණ-, තිබ-ල දම-, පිය-, යෙද-, ල-, ලබ- ආදිය වෙනත් මූල ධාතුවල පූර්වක්‍රියා රූපය සමග යෙදීම සිංහලයේ එක් වාක්‍ය රටාවකි. මේ සංයෝජනයේදී ඒවා තමන්ට හිමි මූලිකාර්ථය හැර පූර්වක්‍රියා රූපයේ තිබෙන ක්‍රියාධාතුවෙන් ප්‍රකාශිත අර්ථය සංස්කරණය කරන හෙයින් ආධාර ක්‍රියා/අදර ක්‍රියා හෙවත් උපකාරක ක්‍රියා නමින් හඳුන්වනු ලැබෙයි.[1] මේ අතරින් දෙකක්, එනම් ගන්- සහ ල-, මුදාගන් හෝ කියාල වැනි සාධිත ධාතු සාධනයේදී පූර්ව ක්‍රියාවට එකතුවන හෙයින් ප්‍රත්‍යය ලෙස **සිදත්සඟරාව** හඳුනා ගනියි.[2] මේ අතර උපපදයක්. එනම් දෙවන පදයක්, සමග යෙදෙන ගන්-, දම-, ලා-, පිය-, තිබ-, ලබ-, ලද-, වෙ- ධාතු උපපදාඛ්‍යාත බව හිස්සැල්ලේ සිරි සුමංගල හිමියෝ පවසති.[3] මේ මතයට අනුව ඉගෙනැගනිමි යන්නෙහි ඉගෙනැ යනු උපපදයයි. ගන් යනු කාල කාරකාදිය ගෙන ආඛ්‍යාතාර්ථය ප්‍රකාශ කරන උපපදාඛ්‍යාතයයි. ගන්-, ල-, ද-, පිය අර්ථ රහිත හෙයින් වද පවතු (ධාතු) නම් වන බව ද ඒවා පූර්වක්‍රියාවක් සමග යෙදෙන බව ද කුමාරතුංග මුනිදාස මහතා ප්‍රකාශ කරයි.[4] සිංහලයේ පැනෙන පූර්වෝක්ත ක්‍රියාධාතුවල වර්ගීකරණය හා හැසිරීම් සම්බන්ධව විද්වතුන් අතර ඒකඟතාවක් නොමැති බව මේ අනුව පැහැදිලි වෙයි.